රුහුණ විශ්වවිද්‍යාලය
**2018/2019 අධ්‍යයන වර්ෂය**
**ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 2000 ස්ථලය**
**දෙවන සමාසික පරීක්ෂණය - 2020 මාර්තු - අගෝස්තු**

**SLS 22613 - විග්‍රහාත්මක වාග්විද්‍යාව**

**පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න**

**කාලය: පැය 03**

---

1.

i. පහත දැක්වෙන වචන ජාත්‍යන්තර ශබ්ද ශික්ෂා අක්ෂරවලින් (IPA) ලියන්න.

(a) සර්වතෝභද්‍ර (b) ස්වයංජාත

(c) අන්තඃස්ථාක්ෂර (d) ඉඟිනළුව

ii. ජාත්‍යන්තර ශබ්ද ශික්ෂා අක්ෂරවලින් (IPA) ලියූ පහත වචන සාමාන්‍ය සිංහල අකුරෙන් ලියන්න.

(a) sauhārdyəyə (b) pratyəvēkʂəɳəyə

(c) art$^{h}$ānvitə (d) mańdəhasə

iii. පහත දැක්වෙන විස්තරයට අදාළ ජාත්‍යන්තර ශබ්ද ශික්ෂා අක්ෂර (IPA) ලියන්න.

a) Front, Open, Unrounded, Long vowel
b) Plosive, Bilabial, Unaspirated, Voiced consonant
c) Fricative, Labiodental, Voiced consonant

iv. පහත දැක්වෙන ජාත්‍යන්තර ශබ්ද ශික්ෂා අක්ෂරවලට (IPA) අදාළ විස්තරය ලියන්න.

(a) ē (b) k$^{h}$ (c) f (d) c

2. වාග්විද්‍යාව (Linguistics) යනු කුමක් දැයි පැහැදිලි කොට ෆර්දිනන්ද් දි සොස්සියෝ (Ferdinand de Saussure) දක්වා පෙර'පර දෙදිග භාෂාධ්‍යයනවල ඉතිහාසයෙහි සන්ධිස්ථාන සමාලෝචනය කරන්න.

3. පහත දැක්වෙන දත්ත පදනම් කොට ගෙන,

(a) අවම යුගල පද (Minimal Pairs) තෝරන්න.
*(b) ශබ්දිම සටහනක් (Phonemic Chart) පිළියෙල කරන්න.*

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| kalə | æňdə | parələ | pissā | b$^{h}$rəmaɳə | balə | sāsənə |
| saňgə | ʃaʃə | dinə | surə | laňkā | b$^{h}$ārə | vanə |
| ædə | b$^{h}$rəmərə | vāsənā | dalə | daňgə | sasə | vaňkə |
| *dīnə* | *vassā* | *baḷə* | *vənə* | *varələ* | *sūrə* | *barə* |

4. පදිම (Morphemes) යනු කුමක් දැයි පැහැදිලි කොට අභිමත ඕනෑ ම භාෂා දෙකක නිදසුන් ඇසුරෙන් සංකීර්ණ වචන පිළිබඳ සංස්ථිතික විග්‍රහයක් කරන්න.

5. පහත සඳහන් වාක්‍යවල සන්දිග්ධාර්ථ ඇත්නම් ඒවා ද දැක්වෙන පරිදි රුක් සටහන් ඇසුරෙන් විචාරයට ලක් කරන්න.

   (i) The student with the black belt hit his enemy with the bat.
   (ii) ආධුනික රංගවේදියා විකට දර්ශන සහිත නාට්‍ය නැරඹුවේ ය.
   (iii) The cricket player talked with his friend with the old phone.

6. විග්‍රහාත්මක වාග්විද්‍යාවේ විවිධ අනුක්ෂේත්‍ර සමග වාක්‍ය විචාරය සම්බන්ධ වන ආකාරය සනිදර්ශන ව පැහැදිලි කරන්න.

7. මෙයින් ඕනෑ ම මාතෘකා **දෙකකට (02)** කෙටි සටහන් ලියන්න.

   (i) ලෙනාඩ් බ්ලූම්ෆීල්ඩ් (Leonard Bloomfield)
   (ii) උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතිය
   (iii) සිංහලයේ ශබ්දිම
   (iv) ප්‍රතිරෝධාත්මක විස්තෘතිය

**(සෑම ප්‍රශ්නයකට ම ලකුණු 15 බැගිනි)**

@@@@@@@@@@@@